# කුරුඳු පැළ හා රෝපණ ද්‍රව්‍ය අපනයනය සීමා කිරීම

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

ඉතා ඉහල ජෛව විවිධත්වයකට හිමිකම් කියන ශ්‍රී ලංකාව ලොව ඇති ජෛව විවිධත්වය සාන්ද්‍රණය වූ ස්ථාන කිහිපයක් අතුරින් එකකි. ශ්‍රී ලංකාව තුල විශේෂිත වූ කෘෂි භෝග සහ ඒවායේ වනගත දර්ශන රැසක් හමුවේ.

කුරුඳු, සාදික්කා, කරාබුනැටි වැනි වානිජ්‍යමය වශයෙන් ඉතා වැදගත් භෝග රැසක් අපගේ දේශීය ශාඛ ජාන කිටුව සඳහා දායක වේ. මේ අතුරින් සහශ්‍ර ගණනාවක් ම කුරුඳු ලංකාවට ඉතා වැදගත් අපනයන භෝගයක් වී ඇත. වාර්ෂිකව කුරුඳු පොතු මෙට්‍රික් ටොන් 10,000 පමණ අපනයන කරන අතර 2001 වසරේ දී මෙහි වාර්ෂික අපනයන ආදායම රුපියල් බිලියන 3.8ක් විය. (මෙය වාර්ෂික කුළුබඩු අපනයන ආදායමෙන් 65%කි). සාම්ප්‍රදායි ක්‍රමයට කුරුඳු නිෂ්පාදනය සඳහා අධික වශයෙන් ශ්‍රමය උපයෝගී වන බැවින් ශ්‍රී ලංකාවේ නිරිත දිග තෙත් කලාපයේ රැකියා ව්‍යවසාය සඳහා මහඟු දායකත්වයක් සපයයි. ස්වභාවික තත්ත්ව යටතේ ශ්‍රී ලංකාවේ භාවිතා කරන කුරුඳු විශේෂය (*Cinnamomum verum*) ශ්‍රී ලංකාවට දේශීය විශේෂයක් වේ. එබැවින් කුරුඳු ශ්‍රී ලංකාවට විශේෂිත වන අතර එය ආරක්ෂා කර ගත යුතු ශාක විශේෂයකි. මෙයට අමතරව තවත් කුරුඳු විශේෂ 07ක් ලංකාවේ දක්නට ලැබෙන අතර මේවා සියල්ලම ශ්‍රී ලංකාවට ආවේණික වේ. ජානමය පදනම භාවිතා කර විවිධ නිෂ්පාදන ඇති කිරීමෙහිලා එම විශේෂද වැදගත් වියහැකි බැවින් ඒවා ආරක්ෂා කර ගත යුතුව ඇත.

දේශීය කුරුඳු කර්මාන්තයට තර්ජනයක් වන අයුරින් කුරුඳු පැල හා රෝපණ ද්‍රව්‍ය විසිතුරු පැලෑටි වශයෙන් පිටරටට ඇදී යාම ඉහල යමින් පවතින බව ශ්‍රී ලංකා රේගුව විසින් පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ අවධානය පිණිස දන්වා ඇත. කුරුඳු අපනයනය ශතවර්ෂ ගණනාවක සිටම සිදුකරන අතර සීෂෙල්ස්, මැඩගස්කරය, බටහිර ඉන්දීය දූපත් සහ මධ්‍යම ඇමෙරිකාව ඇතුළු නිවර්තන කලාපීය රටවල් රැසක දැනටමත් කුරුඳු වගාකර ඇත. එනමුදු ශ්‍රී ලංකාවේ වගා කරන කුරුඳු සඳහා නිරන්තරවම වැඩි ඉල්ලුමක් සහ අගයක් ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ කෘෂි භෝග රෝපණ ද්‍රව්‍ය අපනයනය සම්බන්ධයෙන් නීතියක් නොමැත. 1993, වන සත්ත්ව හා තුරුලතා ආරක්ෂණ ආඥා පනතේ අංක 49 ට අනුව කුරුඳු කුලයේ පමණක් වනගත විශේෂ 03ක් වන *Cinnamomum capparau-coronde, Cinnamomum citriodorum, Cinnamomum litseaefolium* ආරක්ෂා කර ඇත. එම නිසා *Cinnamomum verum* ශාඛය සහ අනිකුත් ආවේණික ශාක විශේෂවල රෝපණ ද්‍රව්‍ය අපනයනය පාලනය කිරීම නොහැකි වී ඇත.

ජෛව විවිධත්ව සම්මුතියේ 15 වන වගන්තියට අනුව සෑම පාර්ශ්වකරුවකුටම තමන් සතු ස්වභාවික සම්පත්වල ජානමය සම්පත් හා ඒවාට ප්‍රවේශය වීම තීරණය කිරීමේ සෛවරී අයිතිය ජාතික නෛතික රාමුවට අනුකූලව තහවුරු කර ඇත. එබැවින් ජෛව විවිධත්ව සම්මුතියේ කේන්ද්‍රස්ථානය වන පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයට එම දේශීය ජාන සම්පත්, ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම සහ වානිජමය අයිතීන් ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇත.

ඉහත කරුණ සම්බන්ධයෙන් කටයුතු කිරීම ජෛව විවිධත්ව ජාතික ප්‍රවීණතා කමිටුවේ නිර්දේශ පදනම් කර ගනිමින් පරිසර හා ස්වභාවික අමාත්‍යාංශය දැනටමත් අරඹා ඇත. මෙහිදී අදාල නීති සම්පාදනය කරන තෙක් ශ්‍රී ලංකාවේ වැදගත් ශාක විශේෂ සහ ජානසම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම ප්‍රවීණයන්ගේ කමිටුවේ උපදෙස් මත සිදු කිරීමට බලාපොරොත්තු වේ.




*Cinnamomum verum*




*Cinnamomum capparu-coronde*



*Cinnamomum citriodorum*




*Cinnamomum litseaetolium*

රූපසටහන් .- A revised hand book to the flora of Ceylon Volume IX pg 113-127